මනෝ වෛද්‍ය විද්‍යාව

# යොවුන් වියේ ලිංගිකත්වය

> ලිංගික ක්‍රියාවලියක් ලබන වින්දනය මෙන්ම එහි අයථා ප්‍රතිඵල ගැන ද දෙමාපියන් දනිති. කවුරු කැමති වුවත් නැතත් ලිංගික ජීවිතයේ පටන් ගැනීමත් සමග ගැබ් ගැනීම ලිංගාශ්‍රිත රෝග හෝ මානසික බිඳවැටීම් යනාදි අවදානම්වලට දරුවන් මුහුණ පානවා ඇත. ස්වභාවික ආශයක් (instinct) වුවත් එය ළමයෙන් යතුරු පැදියක් එලවීම හෝ මත්පැන් භාවිතා කිරීම වැනි දෙයක ඇති අවදානම ලිංගික හැසිරීමේ ද තිබිය හැකි බැවින් එය හැකිතාක් දුරට කල් තැබිය යුතු ය.

විශේෂඥ මනෝවෛද්‍ය
සරත් පඬුවාවල

**යොවුන් දරුවන් ලිංගික කරුණු ගැන හා ලිංගික ක්‍රියාකාරකම් අවශ්‍ය යයි සිතීම ස්වභාවිකය. තම දරුවා මෙවැනි අයෙක්ය සිතීම සමහර විට ලිංගික සබඳතා පැවැත්වූ අයෙක් යයි පිළිගැනීම දෙමාපියන්ට අපහසු කරුණකි. දරුවකුගේ වර්ධනය පිළිබඳව සෑම කරුණකටම වඩා වර්ධනය වන ලිංගිකත්වය ඔහු හෝ ඇය මාපියන්ගෙන් දුරස්වීමට වඩාත් හේතු වනු ඇත.**

තම පුතාට හෝ දියණියට 'පෞද්ගලික ජීවිතයක්' ඇති බව මාපියන් වටහාගත යුතුය. ඔවුනට එහි කොටස්කාරයෙක් වීමට නොහැකිය. ඔවුන් එම ක්ෂේත්‍රයේ දිග දුරක් යා හැකි අතර ඒ පිළිබඳ මාපියන්ට ලබාදිය හැකි රැකවරණය සීමිතය. ඇත්තෙන්ම වැඩිහිටි වියට පා තගද්දී ලිංගිකත්වය ද ඒ සමග අත්වැල් බැඳගෙන එනු ඇත. තමාගේ අතීතයට විශේෂයෙන් යොවුන්වියට එබී බැලීමට ඕනෑම වැඩිහිටියකුට පුළුවන.

තමන් කොතෙක් දුරට ලිංගික සිතුවිලිවලින් හා ඒ පිළිබඳ මනෝ ලෝකයක් ඒ පිළිබඳ නොයෙකුත් සැලසුම්වල හා අනෙකුත් ලිංගික ක්‍රියාකාරකම් වල නිරත වූවාදැයි ආවර්ජනය කළ හැක. ඇත්තෙන්ම යොවුන් වියේ ලිංගිකත්වය අන් සැමදේම යටපත් කරමින් ප්‍රමුඛතාවක් ගනු ඇත.

යොවුන් දරුවන් ලිංගික කටයුතු ගැන කුතුහලයක් දක්වති. එසේම ඒ ගැන නොයෙකුත් අත්හදා බැලීම්වල නිරත වෙති. වාහනයක් පැදවීම නැතහොත් මත්පැන් ගැනීම ආදිය වගේම එය වැඩිහිටි බවේ සංකේතයක් ලෙසත් මුහුණ පෑ යුතු අභියෝගයක් කොටත් සලකනු ඇත. යෞවනයන් අතර ලිංගික සබඳතා ඇති වී ගැබ් ගැනීම සැමවිටම ප්‍රශ්නයක් වනු ඇත. එවැන්නක් සිදුවනුයේ ඔවුන් ස්ථාවර ලිංගික සබඳතා ඇති කර ගැනීම සඳහා මානසික වශයෙන් පරිණත බවක් නොලබා සිටියදීය. එසේම දිගුකාලීන ලිංගික ජීවිතයක් ගෙනයාමේ ස්ථිර අදිටනක් ද ඔවුනට නැත.

ලිංගික ක්‍රියාවලියක් ලබන වින්දනය මෙන්ම එහි අයථා ප්‍රතිඵල ගැන ද දෙමාපියන් දනිති. කවුරු කැමති වුවත් නැතත් ලිංගික ජීවිතයේ පටන් ගැනීමත් සමග ගැබ් ගැනීම ලිංගාශ්‍රිත රෝග හෝ මානසික බිඳවැටීම් යනාදි අවදානම්වලට දරුවන් මුහුණ පානවා ඇත. ස්වභාවික ආශයක් (ඪදඑබඑදජබ) වුවත් එය ළමයෙන් යතුරු පැදියක් එලවීම හෝ මත්පැන් භාවිතා කිරීම වැනි දෙයක ඇති අවදානම ලිංගික හැසිරීමේ ද තිබිය හැකි බැවින් එය හැකිතාක් දුරට කල් තැබිය යුතු ය.

ලිංගිකත්වය මානසික ක්‍රියාවලියකි. මාපියන් යොවුන් දරුවන්ට කියන හෝ නොකියන දේ බොහෝ විට ඔවුන්ගේ අත්දැකීම් හා ආකල්ප මත රඳා පවතී. ලිංගිකත්වය පිළිබඳ මාපිය අත්දැකීම් උභයාවේගිකත්වයකින් හෙවත් ඒ සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ අදහස් ඇති බවකින් හෝ අප්‍රසන්න බවකින් යුක්ත නම් ඔවුන් තම දූ දරුවන්ගේ ලිංගික ජීවිතය පාලනය කිරීමට හෝ යම් යම් තහංචි පැනවීමට හෝ උත්සාහ කරනු ඇත. අන් හැම කටයුත්තකදීම මෙන්ම දරුවන් ප්‍රවේශම් කර ගැනීම හා ජීවිත ගැන වගකීම හා තීරණ ගැනීම පිළිබඳව තුලිත බවකින් යුතුව දෙමාපියන් කටයුතු කළ යුතුය.

## මාපිය ආකල්ප

මෙරට දෙමාපියන්ගෙන් බහුතරයක් යොවුන් දරුවන්ගේ ලිංගිකත්වය පිළිබඳව කතාබස් නොකරති. ඇත්තෙන්ම ඔවුනට එය නුහුරු දෙයකි. එවන් අය බොහෝ දෙනෙක් කරනුයේ හැකිනම් යොවුන් ගැහැනු හා පිරිමි දරුවන් අතර සබඳතා හා ගනුදෙනු හැකිතාක් අඩු කරලීමට උත්සාහ කිරීමයි. ඔවුන් බොහෝ විට කල්පනා කරන්නේ යොවුන් ගැහැනු පිරමි මිතුරුදමක් සෑම විටම විවාහයෙන් කෙළවර විය හැකි බවයි. මේ නිසා තමාගේ දරුවා මිතුරුදම් පවත්වන්නේ නැත්නම් පෙම් සබඳතා පවත්වන්නේ කා සමගද යන්න පිළිබඳව ඔවුහු විස්තරාත්මක තොරතුරු සොයා බලති. ඔවුන්ගේ ;දමාපියන්ගේ කුලමල නැති බැරිකම් ආදිය ද මීට අඩංගුය. සම්බන්ධතාව පවත්වාගෙන යන්න තමන් සලකා බලන යම් යම් කරුණු අනුව පිළිගත හැකි මට්මටක සිටී නම් ඊට දක්වන විරෝධය අවම ය. තමන්ට පිළිගත නොහැකි කරුණු ඇති විට ඊට තදබල විරෝධයක් පල කරමින් එය වහාම නවතා දැමිය යුතු බවට බලපෑම් දකුණු ඇත.

ඉහත සඳහන් ආකාරයේ විනිශ්චයන් ගැනීම හෝ යමක් තර්ජනාත්මකව කිරීමට එපා යයි පැවසීම යොවුන් දරුවාගේ ගැටළු විසඳීමට උපකාරි නොවේ. එමගින් ඔවුන් නැවැත්විය නොහැකි අතර කුමන ආකාරයකින් හෝ එය කරගෙන යනු ඇත. සමහර දෙමාපියන් පෙම් සබඳතා හා ලිංගිකත්වය ගැන උභයාවේගික අදහස් දරන අතර දරුවන් අතර මෙවන් සබඳතාවලදී තදින් සිතට ගත යුතු කිසිවක් සිදු නොවන්නේ යයි ඔවුන් සිතනු ඇත. තම දරුවා 'වැරදි වැඩක්' කරන්නෙක් නොවන බවද සිතනු ඇත. මක්නිසාද යත් එයින් ඔවුන්ගේ මනසට ද පහසුවක් දැනෙන බැවිනි. ඇත්තෙන්ම සෑම දෙයක්ම හොඳින් සිදුවේ නම් මෙවැනි ආකල්පයක්

දුරීම වරදක් නොවේ. නමුත් යොවුන් ගැහැනු පිරිමි සබඳතාවලදී සිදුවන්නට හැකි දේවල් ගැන කල්තබා යමක් කිසිවකුට කිව නොහැකිය. දරුවාට අවශ්‍ය අවවාද අනුශාසනා නොලැබීම මගින් අවැඩක් සිදුවිය හැකිය. දරුවා ආරක්ෂා සහිතව හා ඔහු හෝ ඇයට අවශ්‍ය තොරතුරු දැන ගැනීම ආත්ම විශ්වාසයක් ලබාගන්නා තුරු මෙවැනි ආකල්ප ඇරීම සුදුසු නොවේ.

සමහර දෙමව්පියෝ තම දරුවාගේ ලිංගික ජීවිතය ගැන සියලු තොරතුරු දැන ගැනීමට උත්සාහ කරති. ඒවා ගැන දැනුවත් වීම ඔවුනගේ සිත් පිනවන්නක් විය හැකිය. ඇත්තෙන්ම මෙවැනි දෙයක් කරන්නේ තම දරුවන් අමාරුවේ වැටීම වලකාලීමට නොව ඉන් කිසියම් වින්දනක් ලබාගැනීමට විය හැකිය. මෙය යොවුන් දරුවාගේ පෞද්ගිකත්වය පිළිබඳ සාධාරණ නොවන ඇඟිලි ගැසීමකි. කෙසේ වුවද මෙවැනි තත්වයකදී දරුවා මාපියන්ට කිසිවක් නොපවසනු ඇත. තමන් කරන කියන දේ ගැන කිසිවක් දැන ගැනීමට ඉඩක් නොතබනු ඇත.

'ඒක වැරදියි' නැත්නම් 'ඒක හරි නෑ' ඒ නිසා කරන්නට එපා යනුවෙන් මාපියන් දරුවකුට පවසන්නට පුළුවන. ඇත්තෙන්ම එය මාපියන් සිතන විධියයි. එය අවවාදයක් ලෙස සාර්ථක වන්නේ මාපියන් හා දරුවන් එකම ආචාර ධර්ම පද්ධතියක් පිළිගන්නවා නම් පමණී. යොවුන් වියේ පසුවන්නන් තමන්ට කිරීමට අවශ්‍ය දේ ගැන ක්‍රියාකාරී වන අතර ඒවා හරිද වැරදිදැයි ගන්නා අවසාන තීරණ මාපියන්ගේ එවැනි දේ හා සම්පාත නොවනු ඇත. බොහෝවිට එම පණිවුඩය විවරණය කරන්නේ 'ඒ ගොල්ල මං ඒක කරනවාට කැමති නැති නිසා ඒක කරන එපා කියනවා' යනුවෙන් විය හැක.

යොවුන් ගැහැනු පිරිමි සබඳතාවකදී ආදරයක් නොමැති නම් ඕක කරන්න එපා යන අදහසක් යෞවනයකුට දීම අවදානම් සහිතය. එසේ නොවන බව පවසා තමන් විසින් ගොඩ නගා ගනු ලබන ආචාර ධර්ම උඩ තමන්ගේ පාලනය කරගත නොහැකි ලිංගික ආවේගයක් සතපවා ගැනීමට පෙළඹෙනු ඇත. ඔවුන් ආදරය කිරීමට නාමයෙන් ලිංගිකව හැසිරීමේ අයිතිවාසිකමක් ඇතැම් සිතනු ඇත.

'දැන්ම ඒක කරන්න එපා. ඒකට තව කල් තියෙනවා' යන්න දෙමාපියන්ට තිබිය යුතු යථාර්ථවාදී ආකල්පයකි. මාපියන්ගේ සිතෙහි හටගන්නා බිය සැක ගැන අවංක ප්‍රකාශයක් මෙවැන්නකින් පිළිබිඹු වේ. වයසින් හරියාකාරව මුහුකුරා නොගිය තැනැත්තකුගේ ආදරය අඩු වයසින් ලිංගිකත්වයට හා විවාහයට හේතුකාරක වෙයි' මෙය අනුමත කිරීමට හෝ සාධාරණීයකරණය කිරීමට නොහැක්කකි. ඇත්තෙන්ම එය දිගුකාලීනව නොපවතින අතර ඉක්මනින් බිඳ වැටීමට හේතු වෙයි. යොවුන්වියේ ලිංගිකත්වයට සම්බන්ධ වර්ධනයන් සෙමින් සිදුවන්නේ නම් එය වාසිදායකයි. බොහෝ ජන කණ්ඩායම්වල යොවුන් දරුවන් ස්වාධීන වන තුරු එනම් තමන්ට තමන්ගේ ජීවිතය ගෙන යැමට හැකියාවක් ලැබෙන තුරු ලිංගිකත්වය කල් දැමේ. ඇත්තෙන්ම ලිංගිකත්වයට කාලය හා ශ්‍රමය මෙන්ම මානසික ශක්තිය ද වැයවේ. තමන්ගේ ඇති අනෙකතුත් අපේක්ෂාවන් හා අවස්ථාවන් ඉදිරියේ තිබියදී ලිංගිකත්වය තුළ යොවුන් දරුවන් ගිලී යනු ඇත. එසේම එය ඇබ්බැහි වීමකට දිරි ගන්වන්නකි. මුල් වරට ලිංගික සබඳතාවක් ඇතිකර ගත් අයකුට ඉන් මිදීයන්නට අපහසු කාර්යයක් වනු ඇත. මේ නිසා ලිංගිකත්වය පසුවට කල් තැබීම ඔවුනට අවාසිදායක නොවන බවට හැඟෙන්නට කටයුතු කිරීමට මාපියන් උත්සාහ කළ යුතු ය.

**සමහර දෙමව්පියෝ තම දරුවාගේ ලිංගික ජීවිතය ගැන සියලු තොරතුරු දැන ගැනීමට උත්සාහ කරති. ඒවා ගැන දැනුවත් වීම ඔවුනගේ සිත් පිනවන්නක් විය හැකිය. ඇත්තෙන්ම මෙවැනි දෙයක් කරන්නේ තම දරුවන් අමාරුවේ වැටීම වලකාලීමට නොව ඉන් කිසියම් වින්දනක් ලබාගැනීමට විය හැකිය. මෙය යොවුන් දරුවාගේ පෞද්ගිකත්වය පිළිබඳ සාධාරණ නොවන ඇඟිලි ගැසීමකි.**

## ලිංගිකත්වය ගැන දැනුවත් වීමට සහාය වීම

යොවුන් දරුවන් වර්ධනය වන ලිංගිකත්වය පිළිබඳව අවබෝධයකින් යුක්ත විය යුතුය. එවිට ඒ ගැන මාපියන්ට අහස පොළව ගැටලන්නට හේතුවක් නැත. ලිංගිකත්වය පිළිබඳ තම දෙමාපියන් දක්වන ආකල්ප ඒ ගැන දක්වන උභයාවේගික බව හා බිය සැක පිළිබඳව යොවුන් දරුවන් ලෙහෙසියෙන් වටහා ගනු ඇත.

යොවුන් දරුවන්ට ලිංගික කරුණු පිළිබඳව හෙඳ අවබෝධයක් තිබිය යුතු අතර එවැන්නක් තිබෙන විට මාපියන්ද ස්ථිරව දත යුතුය. හැකි නම් ඒ පිළිබඳව කථාබස් කිරීමට මාපියන් උත්සාහ ගත යුතු ය. බොහෝ දෙමව්පියන්ට එය නුහුරු හා අපහසුදයක කටයුත්තක් වනු ඇත. පිළියම වන්නේ ඊට සුදුසු පොත්පත් කියවීමට අවස්ථාව ලබාදීමය. ඇත්තෙන්ම යොවුන් දරුවන් අසභ්‍ය ලිංගික ප්‍රකාශන කියවීමට පෙළඹිය හැකිය. මෙවැනි දේවල අඩංගු වන්නේ ලිංගික ක්‍රියාකාරකම් පිළිබඳ අතිශයෝක්තියෙන් ලියවුන කථාවන් මිස ලිංගිකත්වය ගැන යොවුන් දරුවන් දත යුතු දේ නොවේ. එවැනි ප්‍රකාශන ඔවුන්ගේ පොත්පත් අතර තිබී මාපියන් අතට පත්වන්නට පුළුවන. එවැනි අවස්ථාවලදී ඒ ගැන විශාල කලබැගැනියක් ඇති කිරීම යෝග්‍ය නැත. ඇත්තෙන්ම උපත් පාලනය ගැන ලිංගාශ්‍රිත රෝග පිළිබඳව ඔවුන් දැනුවත් විය යුතුය. ලිංගික යන්ත්‍රන පිළිබඳ මූලික කරුණුවලට වැඩි යමක් ඔවුන් දත යුතුය. ගැහැනුන් හා පිරිමි ශාරීරික මෙන්ම මානසික වශයෙන්ද එකිනෙකාට ප්‍රතිචාර දක්වන අයුරු පිළිබඳව යමක් දත යුතුය. මේවා ඉතා නුහුරු, සාකච්ඡා කිරීමට අපහසු කරුණු විය හැක. දෙමාපියන් යොවුන් දරුවන් සමගමේ ගැන කතාබස් කිරීමට නොයන්නේ නම් එවන් ගැටළු පැන නගින විට ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට පැකිලීම හෝ බියවීමත් සිදුවිය හැකි බව සිත්හි තබා ගත යුතුය. යොවුන් දරුවන් තමන්ගේ ජීවිතයේ නොයෙකුත් කටයුතු පිළිබඳව අවබෝධයකින් හා වගකීමකින් යුතුව කටයුතු කරයි නම් ලිංගික ජීවිතය පිළිබඳවද එසේ කටයුතු කරනු ඇත .

ලිංගිකත්වය හා එහි වර්ධනය

හිරිමල් වියේදී පවතින අඹයහළුකම් සාමාන්‍යයෙන් එකම ලිංගයේ ළමුන් අතර ය. මිශ්‍ර පාසැලක වුවද තත්වය එසේමය. මේවා තදින් බැඳුනු මිතුරුදම්ය. සමහර විට මෙවැනි මිතුරන් සමලිංගිකව හැසිරෙන්නන් බව අත් අය සිතන්නට පුළුවන. යොවුන් දරුවන් සමහරවිට තම ලිංගයේම අය වෙත යම් ආකර්ශනයක් දක්විය හැකිය. මෙවැනි පිරිමි ළමුන් එකිනෙකාගේ ලිංගික අවයවයන් අල්ලා බැලීම හා සැසඳීම පවා සිදුවේ. ඇත්තෙන්ම මෙය එතරම් ගණන් ගත යුත්තක් නොවේ. මෙය කෙටි කාලීන අවදියකි. කෙසේ වුවත් යොවුන් දරුවන් සමාන්‍යයෙන් තම ලිංගික ජීවිතය අරඹන්නේ විරුද්ධ ලිංගිකයන් සමග මිතුරුදම් ඇති කර ගැනීමෙනි.

වයස අවුරුදු 13-14 කාලයේදී ගැහැනු හා පිරිමි ළමුන් මිතුරුදම් ඇති කර ගනු ලබන්නේ "සෙල්ලමට " මෙනි. මේවා සමාන්‍යයෙන් කෙටි කාලීන වන අතර නොගැඹුරු ඒවාය. ඉතා සමීප සබඳතාවකදී තිබිය හැකි ශාරීරික ගවේෂණත් මෙවැනි අවස්ථාවලදී ඇතිවීමට ඉඩක් නොමැති තරම්ය. ඔවුන් එකිනෙකාට ළංව හිඳ කථා බස් කිරීම, දිවා ආහාරය ගැනීම ආදියෙහි නිරත

වීමට පුළුවන. නමුත් අහුමුළුවල නතිවීමට උත්සාහ නොකරනු ඇත. ඔවුන් ජෝඩු වශයෙන් සිටීමට පෙළැඹෙති. ඇත්තෙන්ම මෙයින් ඔවුන් යම් වින්දනයක් ලබනවාට වඩා මිතුරන් අතර යම් තත්වයක් ලබා ගැනීම හා ඔවුන් පිනවීමට පෙලඹෙති. කෙසේ වුවත් සාමාන්‍යයෙන් තම ලිංගයේම මිතුරන් ගේ සමාගමය ඔවුන්ට වඩාත් ප්‍රියමනාප වනු ඇත.

ගැහැනු ළමුන් ගැහැනු මිතුරර් හා පිරිමි ළමුන් පිරිමි මිතුරන් හා සමග සිටින විට නිතර කතාබස් කරන්නේ විරුද්ධ ලිංගිකයන් ගැනය. ඔවුනු තම පොත්පත්වල සටහන් සැසඳීම, කවුරුන් විසින් කාහට කුමක් කරනු හෝ කියනු ලැබුවාද යන්න හෝ යමෙක් කළ කී දේ කෙතරම් දුරට සත්‍යද යන්න සොයා බැලීම වැනි දේ ගැන කියවීමට කැමති වනු ඇත. මෙවන් ඔපදූප බොහෝවිට හානිකර ඒවා නොවන්නට පුළුවන. කෙසේ වුවත් කලානුරකින් ගැහැනු පිරිමි ළමුන් ගැන නොයෙකුත් වැරදි විනිශ්චයන් .කිරීම මගින් ඔවුන්ගේ ජීවිතයටම හානි පැමිණිය හැකිය. අවාසනාවකට මෙන් පිරිමි ළමුන් එකිනෙකා තරගයට මෙන් ලිංගික ගවේෂණවලට පෙළඹෙන්නට පුළුවන. යොවුන් වියේදී අසාධාරණ ද්විත්ව ප්‍රමිතීන් ක්‍රියාත්මක වන බව විශේෂයෙන් ගැහැනු දරුවන්ට දක්නට ලැබේ. ලිංගික ගවේෂණවල යෙදුන පිරිමි ළමුන් තම මිතුරන් විසින් අගය කරනු ලැබවත් එම ගවේෂණවලට මුහුණ දෙන ගැහැනු ළමුන් දෙස බලනුයේ අපහාසාත්මකව ය. දුරදිග නොබලා ඇතිවන සබඳතාවලදී ගැහැනු ළමුන් ගැබ් ගැනීම හා වගකිව යුතු පිරිමි ළමුන් මුහුණ පාන ගැටළු ආදිය ගැන යොවුන් පිරිමි දරුවන් තුළ අවබෝධයක් තිබිය යුතුය.

## යොවුන් වියේ ලිංගික චර්යාවන්

ශීඝ්‍රයෙන් වර්ධනය වන ලිංගිකත්වයට ගැහැනු හා පිරිමි ළමුන් විවිධාකාරයෙන් ප්‍රතිචාර දක්වති. පිරිමි ළමුන්ගේ ලිංගික ආශාවන් තදබල වන අතර මුල් කාලයේදී එය ස්වයං වින්දනය මගින් සන්තර්පනය කෙරේ. සාමාන්‍යයෙන් සැම පිරිමි ළමයකුම පාහේ ස්වයං වින්දනයෙහි යෙදේ. හිරිමල් වියේ ගැහැනු දරුවන් ලිංගිකත්වය ගැන කල්පනාවේ නිමග්න විය හැකිය. සමාන්‍යයෙන් ඒවා චමත්කාරජනක මනඃකල්පිත ප්‍රේම සිතුවිලි විය හැකිය. හැඟීම් හට ගැනුනත් ඔවුන් ක්‍රියාකාරී බවින් අඩුය. ගැහැනු දරුවන්ගේ ලිංගික ආශාව වර්ධනය වන්නේ තරමක් සෙමින් බව පෙනේ. එය ලිංගික අවයව කරා යොමුවීමට කාලයක් ගතවේ. යොවුන් ගැහැනු දරුවන්ට වඩා පිරිමි දරුවන් අතර වඩා ක්‍රියාකාරී ලිංගික ජීවිතක් තිබීම පුදුමයට කරුණක් නොවේ. තමන්ට වඩා වැඩිමහලු පිරිමි ළමුන්ට හෝ නළුවන් වැනි අය කෙරෙහි මනඃකල්පිත හැඟීම් පහළ වීමත් එවැනි අවස්ථාවලදී පිරිමි ළමුන් මෙන්ම ගැහැනු දරුවන් ද ස්වයං වින්දනයෙහි යෙදෙති.

ගැහැනු දරුවන්ගේ ලිංගික ආශාව වර්ධනය වන්නේ තරමක් සෙමින් බව පෙනේ. එය ලිංගික අවයව කරා යොමුවීමට කාලයක් ගතවේ. යොවුන් ගැහැනු දරුවන්ට වඩා පිරිමි දරුවන් අතර වඩා ක්‍රියාකාරී ලිංගික ජීවිතක් තිබීම පුදුමයට කරුණක් නොවේ. තමන්ට වඩා වැඩිමහලු පිරිමි ළමුන්ට හෝ නළුවන් වැනි අය කෙරෙහි මනඃකල්පිත හැඟීම් පහළ වීමත් එවැනි අවස්ථාවලදී පිරිමි ළමුන් මෙන්ම ගැහැනු දරුවන් ද ස්වයං වින්දනයෙහි යෙදෙති.

මැදි යොවුන් වියේ ලිංගිකත්වය ගැහැනු හා පිරිමි ළමුන් දෙදෙනෙක් අතර ඇතිවන සුරතල් වීමකට පමණක් සීමාවිය හැකිය. සමවයසේ පිරිමි ළමුන් ගැහැනු ළමයින්ට කලින් ලිංගිකව හැසිරෙති. බටහිර රටවල අධ්‍යනයන්ට අනුව එම රටවල වයස අවුරුදු 18 පමණ වන විට පිරිමි ළමුන්ගෙන් 75%ක් පමණ හා ගැහැනු ළමුන්ගෙන් 50% පමණ සංසර්ගයේ යෙදී ඇති බව සොයාගෙන ඇත. බොහෝ යොවුන් දරුවෝ දෙමාපියන් තම වයසේ සිටි කාලයේදී මෙන් නොව ඊට වඩා ලිංගික වශයෙන් දැනුමැති හා අත්දැකීම් ලැබුවෝ වෙති. කෙසේ වුවත් නිතර තාවකාලික ලිංගික සබඳකම් ඇති කර ගන්නේ ඉතා සුළු පිරිසකි. තරුණ වියේ බොහෝ ලිංගික හමුවීම් අවස්ථාවාදී ඒවාය. මේවා කිසිදු සැලසුමකට අනුව සිදු නොවන අතර සමහරවිට ගැබ් ගැනීමෙන් කෙලවර විය හැකිය.

බොහෝ ගැහැනු පිරිමි දරුවන් මුල් අවදියේ කණ්ඩායම් වශයෙන් සිටියද මැදි යොවුන් විය පසුවන විට ජෝඩු ගැසී කාලය ගත කරන්නට පටන් ගනිති. කලින් නියම කර ගත් වේලාවල වරින්වර මුන ගැසෙති. මෙවන් හැසිරීම් අවුරුදු 15 පමණ ගැහැනු දරුවන් හා 16 ට වැඩි පිරිමි ළමුන් අතරද දක්නට ලැබේ. මොවුන් ලියුම් ඡායාරූප ආදිය හුවමාරු කර ගනිති. මෙරට විශේෂයෙන් සමාන්‍ය පෙළ හා උසස් පෙළ සිසුන් අතර මෙවන් සබඳතාවන් සුලබ ය. පාසල් කාලයට අමතරව බොහෝ පංතිවලට සහභාගී වීමෙන් මෙවන් සබඳතාවලට රුකුලක් ලැබී තිබේ. කිසිවකුගේ අධීක්ෂණයකින් තොර බැවින් මෙවන් කටයුතු පහසුවෙන් සිදු කර ගනිති. අහුමුවල විශේෂයෙන් බස්රථවල පසුපස අසුන්, උද්‍යාන හා මුහුදු වෙරළ ආදී ස්ථානවල නතිවී ලංව හිඳ ගවේෂණාත්මක හැසිරීම්වල යෙදෙති. බරපතල ප්‍රශ්නයක් වී ඇත්තේ මෙවන් අයට පැය ගණනට කාමර කුලියට සැපයීමට සමහර හෝටල් හිමියන් සූදානම් වී සිටීමයි. තැරැව් කරුවන් වශයෙන් සාමාන්‍යනේ කටයුතු කරන්නේ ත්‍රිරෝද රථ රියදුරන්ය.

පෙම් සබඳතා පවත්වාගෙන යමින් සිටියදී සමහර යොවුන් ගැහැනු ළමුන් තරුණයන් සමග නිවසින් පැන යති. කලින් සැලසුම් කර ගන්නා ලද පරිදි බොහෝවිට දන්නා හඳුනන තැනක දින කිහිපයක් නැවතී ලිංගික සබඳකම් පවත්වති. යොවුන් වියේ මේ අයුරින් හැසිරෙන ගැහැනු පිරිමි දරුවන්ට යථාර්ථය අවබෝධ වන්නේ මේ සමය අවසාන වූ පසුය. නන්ද මාලනිය ගායනා කරන "යනවා නම් අතේ මං අරන් යන තැනකට යන්න රත්තරන්" යන ගීතයෙන් මෙවන් අයගේ බොළඳ සිතුවිලි පිළිබඳව අවබෝධයක් ලැබෙයි.

පෙම් සබඳතා පවත්වාගෙන යන යොවුන් දරුවන්ගෙන් බොහෝ දෙනෙක් තමාගේ වටිනා කාලයෙන් සැහෙන කොටසක් සබඳතා පැවැත්වීම හා ඒ සම්බන්ධව මනෝ ලෝකයක ජීවත්වීමට ගත කරති. ඒ නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඩාලවන අතර වෙනත් බාහිර ක්‍රියාකරකම්වල නිරත වීමට අසමත් වෙති. කෙසේ වුවත් තරුණ වියේ ගැහැනු පිරිමි මිතුරු සබඳතා ඇතිවීම වැදගත්ය. බැඳීම් ඇතිවුණත් ඒ පිළිබඳ අන්තයට නොයාම හා ඒවා බිඳ වැටීම ආදිය මනෝ සාමාජීය වර්ධනයේදී වැදගත් වනු ඇත. ඇත්තෙන්ම මෙවැනි දෙයකට නිදහස ඔවුනට තිබිය යුතුය. මෙමගින් විරුද්ධ ලිංගිකයන් ගැන ඔවුනට දැනුවත් විය හැකිය. සමහර බැඳීම් කෙතරම් ප්‍රබලද යත් ඒවා බිඳ වැටීමෙන් හට ගන්නා දුක් දොම්නස ඉතා තදබලය. මෙරට දිවි නසා ගන්නා හෝ දිවි නසා ගැනීමට උත්සාහ කරන තරුණ පිරිසෙන් සැහෙන දෙනෙක් පෙම් සබඳතා බිඳ වැටීම නිසා හට ගත් වියෝවෙන් ශෝකයට පත්වූවෝ වෙති. මේ නිසා තවම දූ පුතුන්ගේ පෙම් සබඳතා තිබී ඒවා බිඳවැටුණු විට මාපියන් ඒ පිළිබඳ අවතක්සේරුවෙන් කටයුතු කිරීම බරපතල දෙයක් විය හැකිය. සමහර ළමුන්ට චිත්තවේගීය හෙයින් මාපියන්ගෙන් වෙන්වීම අපහසුය. මෙවැනි යොවුන් දරුවන් විරුද්ධ ලිංගිකයෙක් සමග සබඳතාවක් ගොඩ නගා ගත් එය කඩින්

බැඳුණු එකක් වනු ඇත. තමන් සමග බැඳුණු පුද්ගලයා මත මානසිකව යැපෙන සුළු මට්ටමකින් පවත්නා මෙවන් සබඳතා වලදී වියෝවීමේ ප්‍රතික්‍රියාව ඉතා තදබලය. ඒ නිසා මෙවැනි අවස්ථාවලදී දෙමව්පියන්ගේ සස්වැසීම ඇතුළු අනෙකුත් මානසික සහාය අත්‍යාවශ්‍ය වනු ඇත.

## ගැටළුවලින් පීඩිත ළමුන්

බාහිර බලපෑම්වලින් දරුවා ආරක්ෂා කරගැනීමට මාපියන් කොපමණ වෙර දැරුවත් එය පහසු දෙයක් නොවේ. අවරණය වූ පවුල් පරිසරය තුළින් ලිංගික සම්බන්ධතා සහිත වැඩිහිටි ලොවට ප්‍රවිෂ්ඨ වීදේ හෙඳින් අනුවර්තනය වූ හා සාපේක්ෂ වශයෙන් සැහැල්ලුවෙන් සිටින ළමුන්ට පවා මෙය අදාළය. ඇත්තෙන්ම මාපියන්ට මුහුණ දිය යුතු විශේෂ ප්‍රශ්න තිබේ.

සැම දරුවෙක්ම තම ශීඝ්‍රතාවකින් පරිණත නොවේ. ඒ නිසා නොයෙකුත් වයස් මට්ටම්වල (අඩු හෝ වැඩි) ඇතිවන ලිංගික අත්දැකීම් අත්‍යවශ්‍යයෙන්ම අසාමාන්‍ය නොවන අතර ඒවා අපගමනයන්ද නොවේ. අවුරුදු 13 හෝ 14 ළමයින් ලිංගික සබඳතාවක නිරතවන බව දැනගැනීම මාපියන් සිත් කලඹන හා බිය ගෙන දෙන්නක් විය හැකිය. නමුත් ඊට තදබල ප්‍රතික්‍රියාවක් දැක්වීම සුදුසු නැත. එය හටගැනීමට තුඩුදුන් තත්වය ගැන විමසා බැලිය යුතුය. දරුවාගේ සාමාන්‍ය හැසිරීම පිළිබඳ ගැටළු නොමැතිනම් එනම් ඔහුගේ හෝ ඇයගේ මාපියන් සමග සහයෝගයෙන් කටයුතු කරයි නම් , අධ්‍යාපන කටයුතුවල හොඳින් නිරතවෙයි නම් , යහපත් මිතුරන් ඇසුරු කරයි නම් , දරුවාගේ ලිංගික හැසිරීම මාපියන්ගේ සිත් තුළ පැකිළීමක් ඇති කළ ද එය ඉමහත් ව්‍යසනකාරී දෙයක් ලෙස නොසැලකිය යුතුය. අවස්ථාවක් ලදෙත් ගැහැනු ළමුන්ට වඩා පිරිමි ළමුන් ලිංගිකව හැසිරෙනු ඇත. මෙය ඒ පිළිබඳ තම කුතුහලය මත හෝ තමා අත් අය ඉදිරියේ චණ්ඩියෙක් වීම වැනි කරුණු මත සිදුකරනු ඇත. බොහෝ යොවුන් දරුවන් තම සිතුමතයට ලිංගික සබඳතාවක නිරතවනවාට වඩා සිදු වන්නේ තමාට වඩා වැඩිහිටියකුගේ බලපෑම මත එවැන්නක් කිරීමට පෙළඹීමයි. ඇත්තෙනම ඔවුන් එමගින් වින්දනයක් නොලබනු ඇත. බොහෝ විට තමන් වැරදිකරුවෙක්ය යන හැඟීමකින් යුතුව සිත් කැලඹීමෙන් සිටිනු ඇත. ගැහැනු දරුවන් විශේෂයෙන් ගැබ් ගැනීම පිළිබඳ බියෙන් සිටිනු ඇත. කෙසේ වුවත් මෙයින් දිගුකාලීන බලපෑමක් ඇති වන්නේ කලාතුරකිනි. ඔවුන් ඉතා වැරදි හා දඬුවම් ලැබිය යුතු වරදක් කර ඇතැයි යන හැඟීමෙන් මාපියන් කථාබස් කරයි නම් මානසික වශයෙන් ඔවුන් තවත් පිරිහෙනු ඇත. කෙසේ වුවත් එවන් සබඳතාවකින් ඔවුන් වින්දනයක් ලැබුවා නම් එවැනි දෙයක් නැවත නැවත කිරීමට පෙළඹෙනු ඇත.

ලිංගික හැසිරීම් අවුල්ව හෝ මානසික කැලඹීමක් තුළ සිදුවන්නේ නම්, විශේෂයෙන් ම දෙමාපියන් සමග සබඳතා බිඳ වැටුණු යොවුන් ගැහැනු දරුවෙක් විවිධ ලිංගික සබඳතා ඇති කර ගනී නම් එවැන්නක් සම්පූර්ණයෙන් වෙනස් මගක් ගන්නකි.

පිරිමි ළමුන් තුළ ප්‍රචණ්ඩකාරී හෝ අනෙකුත් අසාමාන්‍ය හැසිරීම් ඇතිවන්නාක් මෙන් වගකීමකින් තොර ලිංගික හැසිරීම් ගැහැනු දරුවන්ගේ මානසික කැලඹීමක ලක්ෂණයක් විය හැකිය. මෙවන් දෙයකට විශේෂඥ සහාය අවශ්‍යවනු ඇත.

ලිංගිකත්වය ගැටවර වියේ සංකේතයක් වුවද මීට අනුකූල නොවන යොවුන් දරුවන්ද සිටිති. සමහරුනට තම ලිංගික වර්ධනය දරා ගැනීමට අපහසුවක් දැනේ. ඔවුන් ලිංගිකත්වය ගැන තමන් කිසිදු කැමැත්තක් නැති බව අත් අයට හැඟවීමට තැත් කරති. ලිංගිකත්වයම අදාළ නෙයකුත් දේ ගැන තමන්වැරදිකාරයෙක්ය යන හැඟීම් „සිත් තැවීම්, හා බියමුසු බවක් දැක්වීම මීට හේතුවිය හැකිය. මෙය බොහෝවිට තම දෙමාපියන් ලිංගිකත්වය ගැන දක්වන ආකල්ප නිසා ගොඩ නැගුනක් විය හැකිය. ඒ පිළිබඳ මාපියන්ගේ ප්‍රතිවිරුද්ධ අදහස් දැරීම නිසා යොවුන් දරුවාට ලිංගිකත්වය පිළිබඳ නිවැරදිව කල්පනා කරන්නට , ඊට මුල පුරන්නේ කෙසේදැයි සිතා බලන්නට නොහැකි තත්වයක් ඇතිවිය හැකි ය. ❑

## පියා සබඳ

ඒ මහා වනය තුළ
අප දෙදෙන සරන විට
හෙණ හඬක් නංවමින්
බිහිසුණු වූ වෙඩි පහර
මගේ වම් උරය මත
රිදුම් දී ගැටෙද්දී
සිහිසුන්ව මා වැටුනි
කෙමෙන් මා දෙනෙත හැර
බලද්දී ඔබ දිහා
දයාවෙන් පිරුණු මුදු
ඔබේ නෙත් සඟල තුළ
බලාපොරොත්තුවෙ විමන්
සටහන්ව ඇති අයුරු
දුටිමි මම පිය සබඳ !
උතුරනා රුධිරයෙන්
උරතලය තෙමෙද්දී
මහත්වූ මුරුගසන් වරුසාවෙ
ඒ මහා වනය මැද
මෙමාවත් කර තියන්
මගේ දිවි රකින්නට
කටු අකුල් පීරමින්
බඩ ගගා ආව හැටි
මතකයේ රැඳී ඇත
සොහොයුරකු නැති මෙමට
පිය සෙනෙහෙ නොලද මට
සොහොයුරකු හා පියකු
වී මෙමට සිටිය ඔබ
මා නොසිතු මොහොතකදී
කිසිවකුට නොම කියා
සුදු පොරෝනාව යට
සැඟවුනේ ඇයි සබඳ !

ශෝභා හෙට්ටිආරච්චි